**ත්‍රිකුණාමලය නගර සභාව**

**-----------------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**---------------------------**

ගිණුම් පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා රු.2,297,514 ක් වූ ස්ථාවර තැන්පතු මත පොලී ආදායම රු.2,234,125 ක් ලෙස ආදායම් ප්‍රකාශනයට ගෙන තිබූ බැවින් වර්ෂය සඳහා ආදායම රු.63,389 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂය සඳහා රු.753,333 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම සහ ප්‍රවර්තන වර්ෂය සඳහා රු.63,389 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව, පොදු ගබඩා විෂයයන්වල මුළු වටිනාකම රු.11,905,355 ක් වුවද එය රු.11,103,093 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින්, පොදු ගබඩා විෂයයන්වල වටිනාකම රු.802,262 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා නාවික හමුදාවට හා පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු එකතුව රු.10,889,375 ක මුදල 2016 වර්ෂයේදී ගෙවා තිබුණි. එහෙත් එය මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් ලෙස දක්වා තිබුණි.

(ඉ) ඉන්සිනරේටරයක් මිලදී ගැනීම සඳහා සභාව විසින් රු.2,705,000 ක මුදලක් 2015 වර්ෂයේදී වැය කර තිබුණි. කෙසේ වුවද, එය ස්ථාවර වත්කම් යටතේ රු.4,057,500 ක් ලෙස මූල්‍ය

ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් ඉන්සිනරේටරයේ වටිනාකම රු.1,352,500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සේවක ණය ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට රු.19,593,148 ක් වූ හිඟ ණය ශේෂය රු.18,862,595 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එබැවින්, සේවක ණය ශේෂය රු.730,553 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2017 වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා රු.735,540 ක් වූ තානායමෙන් ලැබිය යුතු ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඌ) 2017 වර්ෂයේදී ලැබිය යුතු උසාවි දඩ මුදල් වන රු.15,391,243 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට රු.321,608 ක් වටිනා ඖෂධ තොගයක් ආයුර්වේද මධ්‍යස්ථානයේ ගබඩාවේ පැවති නමුත් එය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඒ) රු.16,887,724 ක මුළු පිරිවැයකට සභාව විසින් ඉදිකරන ලද ශ්‍රවණාගාරය හා ඉන්ධන පිරවුම්හළ වැනි ගොඩනැගිලි ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඔ) වෙළඳපොල සංකීර්ණය, සායන මධ්‍යස්ථානය හා ගිනි නිවීමේ මධ්‍යස්ථානය වැනි ගොඩනැගිලි අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම

රු.11,863,654 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

මුළු වටිනාකම රු.17,501,070 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් වර්ෂ කිහිපයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වුවද, එම විෂයයන් පිළිබඳ පැවැත්ම තහවුරු කිරීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් නොවූ බැවින් එම ගිණුම් විෂයයන් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 177(2) වගන්තිය (255 අධිකාරිය) | මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය සෑම මුදල් වර්ෂයකම මාර්තු 1 දිනට හෝ ඊට පෙර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතු නමුත් එම අවශ්‍යතාවය අනුගමනය කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 1646 | සභාවට අයත් මෝටර් වාහන 38 කට අදාළව මාසික කාර්යසාධන සාරාංශ පවත්වා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(5) | 2015 හා 2017 වර්ෂවලදී නිලධාරීන්ට හා පුද්ගලික පාර්ශවයන්ට ලබාදෙන ලද රු.24,300 ක අත්තිකාරම් නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය — එක් එක් ඉන්ධන පරීක්ෂා කිරීම්වලින් මාස 12 කට පසුව මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය යළි පරීක්ෂා කළ යුතු වුවද, සභාවට අයත් මෝටර් වාහන 38 කට අදාළව එසේ කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,109,142 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,437,984 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.12,671,158 ක වර්ධනයක් දැක්වුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල් කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | ලද ආදායම | දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | ලද ආදායම | දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම |
| | "000" | "000" | "000" | "000" | "000" | "000" | "000" | "000" |
| වරිපනම් බදු | 43,480 | 35,188 | 24,971 | 16,035 | 39,450 | 43,215 | 25,618 | 22,711 |
| බදු කුලී | 20,104 | 21,482 | 16,466 | 5,015 | 13,900 | 21,102 | 12,457 | 8,644 |
| වෙළඳ බලපත්‍ර | 4,500 | 4,442 | 4,442 | - | 4,500 | 4,091 | 4,091 | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දඩ මුදල් | 37,263 | 10,939 | 10,939 | - | 36,822 | 23,140 | 23,140 | - |
| වෙනත් ආදායම් | 24,262 | 6,988 | 6,988 | - | 22,821 | 11,619 | 11,619 | - |

**2.2.2 මුද්දර ගාස්තු**

**------------------**

2016 හා 2017 වර්ෂ සඳහා මුද්දර ගාස්තු මුළු මුදල හඳුනාගෙන ඒවා නැගෙනහිර පළාතේ පළාත් භාණ්ඩාගාරයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 බදු කුලී**

**------------**

අධිකරණ නියෝගය අනුව 2016 වර්ෂය තුළදී බදුකරුවන්ගෙන් රු.4,118,295 ක එකතු මුදලක් හිඟ කඩකුලී අයකර ගැනීම් ලෙස ලැබී තිබුණු අතර මෙම මුළු අයකර ගැනීම් මුළු හිඟ මුදලින් අඩුකර තිබුණි. කෙසේ වුවද, එක් එක් බදුකරුගෙන් අයකර ගැනීම් හඳුනා ගැනීමට හා අදාළ බදුකරුගේ හිඟ මුදලින් එම මුදල කපා හැරීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස හිඟ මුදල් දැනටමත් නිරවුල් කර තිබුණද එක් එක් බදුකරුගේ කඩ කුලී හිඟය තවදුරටත් ඉදිරියට ගෙනැවිත් තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------------**

**3.1 කාර්යසාධනය**

**---------------**

නගර සභා ආඥා පනතේ 4 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, උපයෝගීතා සේවා හා පොදු මංමාවත් පිළිබඳ කාරණා නියාමනය හා පාලනය මඟින් මහජන සුහසාධනය හා සුබ විහරණය ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කළ යුතුය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

**------------------**

නගර සභා ආඥා පනතේ 157 වගන්තියට අනුව ප්‍රධාන කාර්යයන් 40 ක් ඉටු කරගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දක්වා කාර්යයන් 13 කට අදාළව පමණක් අතුරු ව්‍යවස්ථා සම්මත කර ගෙන තිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

**------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව 2017 වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) අත්හැර දැමූ ඉදිකිරීම්**

**-------------------------**

2017 වර්ෂය තුළදී නගර සභාව විසින් රු.3,245,038 ක් වූ ඉදිකිරීම් 2 ක් නිම කිරීම සඳහා සැලසුම් කර තිබුණි. මෙම ඉදිකිරීම් ප්‍රජා මධ්‍යස්ථානවලට ප්‍රදානය කර තිබුණි. එහෙත් මෙම කාර්යයන් 2018 සැප්තැම්බර් 17 දක්වාත් ආරම්භ කර නොතිබුණි. කෙසේ වුවද, මෙම ඉදිකිරීම් කාර්යයන් වෙනත් කොන්ත්‍රාත්කරුවකුට නැවත ප්‍රදානය කිරීමට හා ඉහත ප්‍රජා මධ්‍යස්ථාන අසාධු ලේඛනගත කිරීමට නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි. එබැවින් මෙම ඉදිකිරීම් තුළින් ප්‍රදේශයේ ජනතාව සඳහා ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. විස්තර පහත සඳහන් වේ.

| | ඉදිකිරීමේ නම | ප්‍රජා මධ්‍යස්ථානයේ නම | ගිවිසුමේ දිනය | කාලපරිච්ඡේදය | මුදල |
|---|---|---|---|---|---|
| | | | | | රු. |
| 01. | ත්‍රිකුණාමලය බස් නැවතුම්පොලේ 2 වන මහලේ වහලය, වැසිකිළි අලුත්වැඩියා කිරීම | අරාඩඩි | 2017.10.27 | මාස 02 | 2,089,460 |
| 02. | වරෝධ්‍යා නගර්හි කොන්ක්‍රීට් ජලාපවහනයක් ඉදිකිරීම | ගන්දි | 2017.10.31 | මාස 02 | 1,320,858 |
| | එකතුව | | | | 3,409,318 |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්ලාස්ටික්, පොලිතීන්, කඩදාසි, කාබනික හා වීදුරු වශයෙන් කසළ වෙන්කිරීම සඳහා නගර සභා බල ප්‍රදේශයේ පොදු ස්ථාන, රජයේ ආයතන හා පාසැල් වෙනුවෙන් ප්‍රසම්පාදනය කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ 2017 යොවුන්පුරය වැඩසටහන යටතේ රු.3,160,799 ක් වූ කසළ බඳුන් 664 ක් මිලදී ගෙන තිබුණි. පොදු ස්ථාන හා රජයේ ආයතන සඳහා නගර සභාව විසින් කසළ බඳුන් 240 ක් නිකුත් කර තිබුණි. විගණකවරුන් විසින් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී මධ්‍යම බස් නැවතුම්පොළ, වාහන ගාල් කිරීමේ ස්ථානය, ෆෝට් ෆෙඩ්රික් මාර්ගය හා සභා පරිශ්‍රය සඳහා එකම පාටින්, ලේබලයක් නොමැතිව හා කසළ වෙන්කිරීමක් නොමැතිව කසළ බඳුන් සපයා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, අවශ්‍යතාවය, විධිමත් බෙදාහැරීම් සැලැස්ම හා නඩත්තුව පිළිබඳව සැලකීමෙන් තොරව මිලදී ගත් රු.1,223,400 ක් වූ කසළ බඳුන් 272 ක් 2018 සැප්තැම්බර් 17 දින දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(ii) සභා බල ප්‍රදේශයේ නිවාසවලින් ප්ලාස්ටික්, පොලිතීන්, කඩදාසි, වීදුරු හා කාබනික ලෙස කසල එකතු කිරීම සඳහා සභා අරමුදලින් රු.1,530,800 ක් වූ කසළ මලු 40,000 ක ප්‍රමාණයක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, කසළ වෙන්කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් නොතිබීම හේතුවෙන් රු.1,071,560 ක් වූ කසළ මලු 28,000 ක් 2018 සැප්තැම්බර් 17 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

**(ඉ) පාරිසරික ගැටලු**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව සිමෙන්ති වැඩ, වඩු වැඩ, ගරාජ හා වී මෝල් වැනි ව්‍යාපාර සිදුකරන ව්‍යවසායකයින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නගර සභාවෙන් ලබාගත යුතුය. කෙසේ වුවද, එවැනි පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නොමැතිව ඉහත සඳහන් ව්‍යාපාරයන් සිදු කරමින් පැවතුණි.

(ii) සභා බල ප්‍රදේශය තුළ වර්ෂයකට එකතු කරන කැලි කසළ ප්‍රමාණය ආසන්න වශයෙන් ටොන් 19,350 ක් වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කන්නියා ප්‍රදේශයේ විවෘත ඉඩමකට අවිධිමත් ලෙස එම කසළ අපහරණය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂා කාලයේදී පාරිසරික ගැටලුවලට හා වල් සතුන්ගේ අහිතකර සෞඛ්‍යයට මෙම කසළ බැහැර කිරීම හේතු වී තිබුණි.

**(ඊ) තිරසර සංවර්ධන සැලැස්ම**

2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුව සභාව විසින් අරමුණු, ඉලක්ක හා නිර්නායකයන් තීරණය කර නොතිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව ඔවුන්ගේ දැනුමද ප්‍රමාණවත් වී නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාවට අයත් නිල නිවාසවල පදිංචිව සිටි නිලධාරීන් 34 දෙනෙකු වර්ෂ කිහිපයක් කුලී ගෙවා නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.452,142 ක මුදලක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද, එම හිඟ කුලී අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.3 ඡේදය අනුව, රජයේ නිල නිවාස රජයේ නිලධාරීන්ට පමණක් උපයෝජනය කළ හැක. කෙසේ වුවද, නිල නිවාස 5 ක් සභාව විසින් පුද්ගලික පාර්ශවයන්ට ලබා දී තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 ඡේදය අනුව, රජයේ නිල නිවාස උපරිම වර්ෂ 5 ක් සඳහා ලබා දිය හැකි නමුත් සභාව විසින් නිලධාරීන් 23 දෙනෙකුට වර්ෂ 5 කට වැඩි කාලයක් සඳහා නිල නිවාස ලබා දී තිබුණි.

(ඈ) රු.50,000 ට වැඩි හිඟ වරිපනම් බදු සැලකීමේදී, වර්ෂ 10 ට වැඩි රු.10,913,161 ක් පමණ වූ හිඟ වරිපනම් බදු හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාවට අයත් මෝටර් වාහන 10 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) නගර සභා ආඥා පනතේ 164(2) වගන්තිය අනුව, සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සංචාරක හෝටල්වලින් එම හෝටල්වල මුළු ආදායම පදනම් කරගෙන ගාස්තු අයකළ යුතුය. කෙසේ වුවද, 2016/2017 මූල්‍ය වර්ෂය සඳහා සංචාරක හෝටල් 3 කින් ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. එබැවින් ආසන්න වශයෙන් රු.300,000 ක මුදලක් උපයා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

(උ)	වර්ෂ 1 සිට 9 ක් ඇතුළත කඩ සාප්පු 271 කින් එකතුව රු.19,193,327 ක් වූ හිඟ බදු කුලී සභාව විසින් අයකර ගෙන නොතිබුණි.

(ඌ)	ධීවර සංස්ථාව විසින් මාළු තොග වෙළඳපොල ක්‍රියාත්මක කරන අතර කඩ සාප්පු 62 කින් 48 ක් ඔවුන් විසින් කුලියට දී මසකට රු.480,000 ක මුදලක් උපයන අතර ඔවුන්ගේ පරිශ්‍රයේ වාහන ගාල් කරන ස්ථානයෙන්ද ආදායම් උපයා ගනී. කෙසේ වුවද මෙම ඉඩම නගර සභාවට අයත් වන අතර පිරිසිදු කිරීමේ සේවාවද නගර සභාව විසින් සිදු කරයි. එහෙත් මෙම දේපලවලින් කිසිදු ආදායමක් නගර සභාව විසින් ලබා නොගනී.

**3.3	මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය අනුව, විශ්‍රාම ගිය, මියගිය හා සේවය හැර ගිය නිලධාරීන් 33 දෙනෙකුගෙන් හිඟව පවතින රු.958,231 ක මුදලක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ)	සභාවේ ගණකාධිකාරී තනතුර වර්ෂ 11 කට වැඩි කාලයක සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ)	සභාවේ ලේකම් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් විය යුතුය. කෙසේ වුවද, මෙම තනතුර සඳහා 2017 පෙබරවාරි 28 දින සිට ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ)	කළමනාකරණ සහකාර, සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය සේවිකා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, පරිවර්තක, පුස්තකාලයාධිපති, කාර්මික නිලධාරී, වෙළඳපොල පරීක්ෂක, මෝටර් ක්‍රියාකරවන්නා යන තනතුරු සඳහා වූ පුරප්පාඩු 2018 සැප්තැම්බර් 17 විගණන දිනය දක්වා පුරවා නොතිබුණි.

**3.4	මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	සභාවට අයත් කඩ සාප්පු 374 කින්, කඩ සාප්පු 93 ක් 2014 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවති අතර කඩ සාප්පු 22 ක් 2017 වර්ෂයේදී කුලියට දී නොතිබුණි. කෙසේ වුවද, එම කඩ සාප්පු කුලියට දීම සඳහා සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආසන්න වශයෙන් රු.2,000,000 ක වාර්ෂික ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ)	සභාව විසින් අවසන් වරට 2010 වර්ෂයේදී දේපල තක්සේරු කර තිබූ අතර එම වර්ෂයේ වාර්ෂික වටිනාකමට අනුව වරිපනම් බදු අයකර තිබුණි. එහෙත් දැනට සමහර ගොඩනැගිලි ඉවත්කර සහ නවීකරණය කර තිබුණි. දේපල නැවත තක්සේරු කිරීමට හා නිවැරදි වාර්ෂික වටිනාකම තීරණය කිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ)	ආබාධිත ළමුන්ට අධ්‍යයනයන් සිදුකිරීම සඳහා යටිතල පහසුකම් සැපයීමට නගර සභාව විසින් රු.433,929 ක් වැය කර පවර් හවුස් මාර්ගයේ නිල නිවාස අසළ නගර සභාවේ පැරණි ශාලාව අලුත්වැඩියා කර නව වැසිකිළි ඉදිකර තිබුණි. කෙසේ වුවද, 2018 සැප්තැම්බර් 17

දක්වා එම ශාලාවට ජලය හා විදුලි බලය සැපයීමට සභාවට නොහැකි වී තිබුණි. එබැවින් ආබාධිත ළමුන්ට ඔවුන්ගේ අධ්‍යයනයන් නිසි පරිදි සිදු කිරීමට නොහැකි වී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්කාර්ය වත්කම්**

සභාවට අයත් මෝටර් වාහන 19 ක් අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 01 සිට 09 දක්වා කාලයක් කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි.

**3.5.2 සමීක්ෂණ මණ්ඩල**

2017 වර්ෂය සඳහා පවත්වන ලද සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ විෂයයන් 209 ක් වෙන්දේසියකින් විකිණීමට හා භාණ්ඩ විෂයයන් 36 ක් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, එම නිර්දේශයන් 2018 සැප්තැම්බර් 17 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/28 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**3.6.2.1 කෝනේශ්වර් කෝවිල මාර්ගයේ මැකෙයිසර් ක්‍රීඩා භූමියේ වැටක් ඉදිකිරීම**

ක්‍රීඩා භූමියට වාහන ඇතුළු වීම වැළැක්වීම සඳහා කෝනේශ්වර් කෝවිල මාර්ගයේ මැකෙයිසර් ක්‍රීඩා භූමියේ පැත්තක වැටක් ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 21 දින රු.1,207,850 ක කොන්ත්‍රාත් වටිනාකමට නගර සභාව විසින් ප්‍රජා මධ්‍යස්ථානයකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගෙවීම් බිල්පත්‍රයට අනුව, මෙම වැඩ සතුටුදායක ලෙස නිම කර ඇති බවට සහතික කිරීම මඟින් ජීඅයි පයිප්ප කණු 85 ක් හා මීටර් 300 ජී අයි බට 1 ක් සඳහා රු.567,350 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ප්‍රජා මධ්‍යස්ථානය විසින් එකතුව රු.304,430 කට ජී අයි කණු 58 ක් හා මීටර් 90 ජී අයි බට සවිකර තිබුණි. ඒ අනුව, ජී අයි කණු 27 ක් හා ජී අයි බට මීටර් 210 ක් සඳහා රු.262,920 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ගිවිසුම අනුව ඉදිකිරීම 2017 නොවැම්බර් 20 ට පෙර නිමකළ යුතුය. කෙසේ වුවද, මෙම ඉදිකිරීම 2018 සැප්තැම්බර් 17 දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

ඇස්තමේන්තුගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 01 සිට සියයට 71 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 4.2 නොවිසඳුණු විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 මාර්තු 13 දින නිකුත් කරන ලද රු.3,054,810 ක් වූ විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ත්‍රිකුණාමලය නගර සභාව සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු 5 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන් සඳහා පූර්ව වැඩසටහන් පිළියෙල කිරීමේදී නගර සභාවේ ප්‍රමුඛතා අනුව හඳුනාගත් කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. ඒ වෙනුවට මහජන සෞඛ්‍ය පරීක්ෂක මාර්ගෝපදේශ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින්ම රාජකාරීන් තීරණය කර තිබූ අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ අනුමැතිය යටතේ රාජකාරී සිදු කර තිබුණි. ඒ අනුව, නගර සභාව සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අතර සම්බන්ධීකරණය සතුටුදායක මට්ටමක නොවූ අතර, උපරිම මට්ටමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය සැලසීම සඳහා දායක වී නොතිබුණි.

(ඇ) මලාපවහන ජලය පිරිසිදු කිරීම හා පරිසරයට මුදාහැරීමේ අරමුණින් 2014 වර්ෂයේදී රු.4,044,907 ක පිරිවැයකට මලාපවහන පිරිසිදු කිරීමේ පිරියත ඉදිකර තිබූ අතර එහි අත්‍යවශ්‍ය කාර්යය වන පිරියතහි කොහු ඇතිරීම සිදුකර නොතිබුණි. එබැවින්, පිරිසිදු කිරීමෙන් තොරව පිරියත හරහා මලාපවහන ජලය පරිසරයට මුදා හැර තිබුණි. ඒ අනුව, අපිරිසිදු ජලය මඟින් වන පරිසර දූෂණය වළක්වා ගැනීමේ අරමුණ මෙම පිරියතෙන් ඉටු වී නොමැති අතර ඒ සඳහා වැය කරන ලද වියදම නිශ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

(ඈ) නගර සභාවට අයත් ඉඩම් පුද්ගලික අංශයට භාරදීමට කිසිදු බලයක් සභාපතිවරයාට නොතිබුණද, 2008 වර්ෂයේදී හිටපු සභාපති විසින් සභාවට අයත් පර්චස් 3,212 ක ප්‍රමාණයක ඉඩම් පුද්ගලයන් 576 දෙනෙකුට භාර දී තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 2010 අගෝස්තු 11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයකු ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරන ලදී. ඔහුගේ වාර්තාව අනුව, නගර සභාව විසින් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නොතිබූ බව තීරණය කර තිබුණි. එබැවින්, 2015 මැයි 26 දින පවත්වන ලද පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී තීරණය කළ පරිදි මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කිරීමට ලබා දුන් නියෝගයට අනුව, ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම් විසින් සභාපතිත්වය දරන කමිටුවක් පත් කර තිබුණි. කෙසේ වුවද, අදාළ කමිටුව විසින් 2018 ජුනි 29 වන විටත් මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සභාපතිවරයාට එරෙහිව නීතිමය කටයුතු කිරීම තවදුරටත් ප්‍රමාද වී පැවතුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය බැහැර කරන ලද ඉඩම අලිඇතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා රු.618,858 පිරිවැයකට සභාව විසින් 2014 වර්ෂයේදී විදුලි වැටක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා විදුලි බලය සපයා නොතිබූ බැවින්, අලිඇතුන් විසින් විදුලි වැටට හානි සිදුකර තිබූ අතර දැනට

ඉඩම වටා විදුලි වැටක් නොමැත. සන කසල පරිභෝජනය සඳහා අලිඇතුන් පැමිණෙන බවද නිරීක්ෂණය විය.

(ඊ) රෝහල්වල අනතුරුදායක අපද්‍රව්‍ය පිළිස්සීමේ අරමුණින් නගර සභා බල ප්‍රදේශයේ වීරනගර්හි ඉන්සිනරේටරයක් සවිකිරීම 2015 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර 2017 වර්ෂයේදී නිම කර තිබුණි. ඒ සඳහා දරන ලද වියදම රු.4,230,155 ක් විය. කෙසේ වුවද, ඉන්සිනරේටරය ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි බලය ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් එම ඉන්සිනරේටරය නිෂ්කාර්යව පැවතුණු අතර රෝහල්වල අනතුරුදායක අපද්‍රව්‍ය කන්නියා ප්‍රදේශයේ විවෘත ඉඩමකට තවදුරටත් අපහරණය කරමින් පැවතුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | **විෂයයන්** | අඩුපාඩුව |
|---|---|---|
| i | ගිණුම්කරණය | ලෙජරය අවිධිමත්ව පැවැත්වීම හා ජංගම නොවන වත්කම් හා ආදායම් වාර්තා නොකිරීම. |
| ii | අයවැය පාලනය | ආදායම හා වියදම පුරෝකථනය කිරීමෙන් තොරව අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම. |
| iii | ආදායම් පරිපාලනය | හිඟ ආදායම එකතු කිරීමේ දිගු ප්‍රමාදයන් |
| iv | මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමේදී දිගු ප්‍රමාදයන් |
| v | කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් වැඩ අත්හැර දැමූ කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව කටයුතු නොකිරීම. |